# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,818 - 2013 ජූලි මස 05 වැනි සිකුරාදා - 2013.07.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)



| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1002 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1008 |



*සැ. යු.-* (i) ගල්හින්න ජාමිඅතුල් ෆක්තාහ් අරාබි විදුහල (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(ii) ගබඩා ව්‍යාපෘති (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(iii) සෙරෙට්සෙ බාමා පදනම්භාරය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2013 මැයි මස 10 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට මාසයකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 26 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජූලි මස 12 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.
*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### දෙමළ භාෂාවෙන් විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අගෝස්තු මස 05 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 ජුනි මස 14 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ත්‍රිකුණාමලය | මුතූර් | කොඩ්ඩියාර් බටහිර කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ කොඩ්ඩියාර් පත්තු කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ත්‍රිකුණාමලය. |



## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — මාතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සැහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැලකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2013 අගෝස්තු මස 12 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 ජුනි මස 19 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | අකුරැස්ස | මාතර දිස්ත්‍රික්කයේ වැලිගම් කෝරලය අකුරැස්ස කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මාතර | වැලිගම | මාතර දිස්ත්‍රික්කයේ මිදිගම කොට්ඨාසයේ, උප්පැන්න, මරණ හා වැලිගම් කෝරලය විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මාතර |

07-176

---

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### කාන්තා පොලිස් කොස්තාපල් තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ කාන්තා පොලිස් කොස්තාපල් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් "අධ්‍යක්ෂ, බඳවා ගැනීම්, ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, අංක 375, පළමු මහල, ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති මාවත, කොළඹ 06" යන ලිපිනයට එවිය යුතු ය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ ඉහළින් තමා අයදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2013.09.20 වැනි දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබීමට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර, පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. *වැටුප් ක්‍රමය* :

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2,160 - 17 x 2,880 - රු. 2,54,100

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(අ) දුෂ්කර දීමනා රු. 2,000

(ආ) *සංයුක්ත දීමනා* :

(1) උතුරු සහ නැගෙනහිර සේවය සඳහා රු. 10,500

(2) අනෙකුත් ප්‍රදේශවල සේවය සඳහා රු. 8,400

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරිණියන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටක දී වුව ද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක.)

(ඇ) සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ,

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්,

(ඉ) රාජකාරී සඳහා ගමන් වියදම්, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. *අවශ්‍ය මූලික සුදුසුකම්* :

(අ) *වයස් සීමාව* :

*ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාරගන්නා අවසන් දිනට* වයස අවුරුදු 18-28 ත් අතර විය යුතු ය.

(ආ) *අධ්‍යාපන සුදුසුකම්* :

* අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06ක් සමත් විය යුතු ය. වාර දෙකක දී සාමාර්ථය ලබන අපේක්ෂකයකු ප්‍රථම වාරයේදී විෂයයන් 05ක් සමත් විය යුතු ය.

*සටහන 01* : ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙස ද, අංක 42 සහ 45 දරන ගණිතය විෂයය යුගලය එක් විෂයයක් වශයෙන් ද, සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02* : අ.පො.ස (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුව ද එම විෂයය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03* : වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ.පො.ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ.පො.ස (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) ශාරීරික සුදුසුකම් :

* *උස අඩි 05 යි. අඟල් 02 යි. (අවම),*

*සටහන* : විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවල දී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුව ද අනෙක් සුදුසුකම් සපුරා ඇත්නම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

(ඉ) *දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන්* .— එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතු ය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එය ද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතු ය. යම් අපේක්ෂකයකු උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඊ) *අනෙක් සුදුසුකම්* :

* අයදුම්කාරිය අවිවාහක විය යුතු ය. (දික්කසාද වූවන් ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ.)

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

* අයදුම්පත් අනුව සුදුසුකම් ලබන අයදුම්කාරියන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ

පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

1. මීටර් 1,000 - මිනිත්තු 05, තත්පර 14.

* යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ.

* ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,-
    * *වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.*—කාලය විනාඩි 45 යි. වචන 500 ට නොඅඩු විය යුතු ය.
    * *සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.*—කාලය පැය 01 යි.

06. *වෛද්‍ය පරීක්ෂණය :*
ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරාගනු ලබන අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතු ය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

07. *පසුබිම් පරීක්ෂණය :*

(අ) අයදුම්කාරියගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඇය හා ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඇය ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයදුම්කාරියන් බඳවාගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේ දී අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

08. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :*

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 වැනි දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 වැනි දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරිණියන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබාගත යුතු ය.

* 2007.07.01 වැනි දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරි තනතුරට පහළ තනතුරු දරන නිලධාරිණියන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතු ය.

* පත්වීමේ දින සිට වසර 05 ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරිණියන්ගේ වැටුප් වර්ධක, සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

09. *පත්වීමේ කොන්දේසි :*

* මෙම පත්වීම ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

10. *සේවා කොන්දේසි :*

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරාගනු ලබන අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතු ය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද, මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතු ය.

(ඈ) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරිණියකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන් ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරිනියන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුව ද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 වැනි දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 වැනි දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03 ක ආධුනික සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර, මෙම ආධුනික සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඇයගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම්, ඉල්ලා අස්වීමේ ලිපිය භාර දෙන අවස්ථාවේදීම නියම කරනු ලබන මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතු ය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම භාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙළුමෙහි ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04 ට අනුකූල විය යුතු ය.

(උ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතු ය.

(ඌ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතු ය.

(එ) ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්වරියන්, පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පටිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

11. (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (II අ) වැනි ඡේදයේ ආරම්භයේ පළ කරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළවන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

12. අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපි ලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතු ය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය.) :-

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතක දී ලබාගත් සහතික දෙකක්, (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඈ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික,(තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

13. (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කාරිය තෝරා ගන්නා ලද්දේ නම් ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතුය. එසේ නොමැතිව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ආ) අයදුම්කාරිය විසින් අයදුම්පත්, අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබ අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියකු/නිලධාරිණියක වෙත පෞද්ගලිකව බාර නොදිය යුතු ය.

14. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කාරියන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

සටහන.— පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

එන්. කේ. ඉලංගකෝන්,
පොලිස්පති.

පොලිස් මූලස්ථානය,
කොළඹ 01.

**පොලිස් දෙපාර්තමේන්තුව**

ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතු ය. :————.

(ආ) නම (මුලකුරු සමග) :————.

(ඇ) අයදුම්කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.
(ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කාරිය උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :————.
පළාත :————.

05. (අ) වර්තමාන ලිපිනය :————.
(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඇ) ස්ථිර ලිපිනය :————.
(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.
(ඉ) ස්ථිර ලිපිනයට අදාළ මැතිවරණ කොට්ඨාසය :————.
(ඊ) ස්ථිර ලිපිනයට අදාළ ග්‍රාම නිලධාරී වසම :————.
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :————.
(උ) දුරකතන අංකය - නිවස :————. ජංගම :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන් ද ? (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න) :————.

(ඇ) ඔබ පුරවැසියෙකු වූයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :
* අයදුම්කාරිය :————.
* අයදුම්කාරියගේ පියා :————.
* අයදුම්කාරියගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කාරියගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය :————. (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි)

වයස : (අයදුම්පත් භාරගන්නා අවසන් දිනට)

අවුරුදු :————. මාස :————. දින :————.

08. උස : අඩි :————. අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතික වල පිටපත් ඇමිණිය යුතු ය) :————.

10. අතිරේක සුදුසුකම් :————. (සහතිකපතේ ඡායා පිටපතක් ඇමිණිය යුතු ය)

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකාවක් ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේ ද ? :————.

14. අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන් :
(අ) ———,
(ආ) ———.

15.(අ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවාවේ තනතුරක් සඳහා හෝ ඉල්ලුම් කර තිබේද ? :———.

(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න) :———.

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ හෝ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සේවය කර තිබේ ද ? :———.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න. :———.

16. ඔබ ශ්‍රී ලංකා පොලිස් උප සේවයේ සාමාජිකයෙක් ද ? (එසේ නම් පත්වීමේ දිනය, නිලය, නිල අංකය සඳහන් කරන්න). පත්වීමේ ලිපියේ පිටපතක් අමුණන්න. :———.

17. (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේ ද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය. :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :——.

18. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද ? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු ය :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න :———.

19. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත් ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

20. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේ ද ? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද ? එසේ නම් විස්තර සඳහන් කරන්න. :———.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක් වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———,
අයදුම්කාරියගේ අත්සන.

දිනය :———.

07-62

**අයදුම්පත් කැඳවීමේ නිවේදනය**

"රාජ්‍ය සේවා කොමිෂන් සභාව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයෙහි විධායක නිලධර ගණයේ සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා සීමිත බඳවා ගැනීම."

යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය යටතේ පවත්නා කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ පුරප්පාඩුවී පවතින සහකාර අධ්‍යක්ෂ (දෙපාර්තමේන්තුමය) තනතුරු 14ක් පිරවීම සඳහා සුදුසුකම් සපුරා ඇති අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ ක්‍රමය
කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයේ සේවය කරනු ලබන මෙම නිවේදනයේ අංක 04 කොටසේ සඳහන් සුදුසුකම් සපුරාලන ලද ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරීන් අතුරින් ඉල්ලුම්පත් කැඳවා රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පහත සඳහන් ලකුණු දීමේ ක්‍රමය පදනම් කරගෙන අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර තෝරා ගැනීම සිදුවේ.

02. සේවා කොන්දේසි

තනතුරේ ස්වභාවය : ස්ථිර, විශ්‍රාම වැටුප් සහිත වේ. රාජ්‍ය සේවක පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද ආයතන සංග්‍රහයේ හා අංක 1589/30 හා 2009.02.20 දිනැතිව ප්‍රකාශිත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පරිපාටික රීතිවලටද යටත් විය යුතුය. රාජ්‍ය භාෂාව නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 7/2007 හා ඊට ආනුෂාංගික චක්‍රලේඛ අනුව, අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබා ගත යුතුය.

03. වැටුප් පරිමාණය

වැටුප් කේත අංකය : SL 1 -2006
(වැටුප් පරිමාණය : රු. 22,935-10x645-8x790-17x1,050-53,555 (මාසිකව) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 අනුව, වැටුප් ගෙවනු ලැබේ.

04. සුදුසුකම් :

(i) ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි තනතුරේ ස්ථිර කර තිබිය යුතු ය.

(ii) ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි තනතුරේ වසර දහය (10) ක සක්‍රිය සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

(iii) පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම සම්පූර්ණ කර තිබිය යුතුය.

(iv) සුදුසුකම් ලබන දිනට පූර්වාසන්නතම වසර පහ (05) තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

05. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදී ඉහළම ලකුණු ලැබූ අයදුම්කරුවන් අතුරින් පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

- පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම හෝ කොටසක් පමණක් පිරවීම පිළිබඳ අවසන් තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

| | ශීර්ෂය | | උපරිම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක පළපුරුද්ද සඳහා | 50 | |
| | ● මූලික සුදුසුකමවන අවුරුදු 10ක සේවා කාලයෙන් පසුව එළඹෙන සේවා කාලය සඳහා එක් වසරකට ලකුණු 05 බැගින් | | |
| 02 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් සඳහා | | 20 |
| | ● පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබා ගත් අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සඳහා (කළමනාකරණය, ආර්ථික විද්‍යාව, වාණිජ්‍යය, ව්‍යාපාර පරිපාලනය, තොරතුරු තාක්‍ෂණය, සංඛ්‍යානය හෝ කෘෂි විද්‍යාව ආදී විෂයයන්ගෙන් වූ) | 15 | |
| | ● රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන අවුරුද්දකට නොඅඩු පරිගණක තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා/සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා | 05 | |
| | ● රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබා දෙන මාස හයකට නොඅඩු පරිගණක තාක්‍ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවන් සඳහා | 03 | |
| 03 | නිර්මාණාත්මක කාර්යයන් හා සුවිශේෂී කුසලතා | | 25 |
| | ● දැනට කුඩා ව්‍යාපාර සංවර්ධන අංශය හඳුනා නොගත් එහෙත් ව්‍යවසායකයින්ට ප්‍රයෝජනවත් රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධානවල සහය ලබා ගනිමින් සංවිධානය කළ වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් වැඩසටහන් එකකට ලකුණු 03 බැගින් | 09 | |
| | ● අන්තර් දිස්ත්‍රික් වෙළඳ හුවමාරු වැඩසටහන් වැනි විශේෂ වැඩසටහන් (උදා : නුවරඑළිය මල් වගා කරන්නන්ට මල් අලෙවිය සඳහා කොළඹ දිස්ත්‍රික්කයේ ව්‍යවසායකයින් හඳුන්වා දීම, මොණරාගල දිස්ත්‍රික්කයේ ධාන්‍ය වගා කරන්නන් හෝමාගම විවිධ සේවා සමූපකාර සමිතිය හා සම්බන්ධ කරවීම) වැඩසටහන් එකකට ලකුණු 2 බැගින් | 06 | |
| | ● ප්‍රදේශයේ සම්පත් හඳුනාගෙන ඒ අනුව ව්‍යවසායකයින් එම ව්‍යාපාර සඳහා පෙළඹවීම. (උදා : අපනයනය සඳහා සුළු නිෂ්පාදකයන් යොමු කිරීම, මල් වගාව ව්‍යාපාරික බවට පත් කරන ව්‍යාපාර, කිරි වගාව, කිලෝ පේර වගාව, පොකුණු ආශ්‍රිත මිරිදිය මත්ස්‍ය වැඩසටහන්, දේශීය ඖෂධ වගාව) වැනි විශේෂ ව්‍යාපෘති වෙනුවෙන් වැඩසටහන් එකකට ලකුණු 02 බැගින් | 10 | |
| 04 | සම්මුඛ පරීක්‍ෂණයේදී දක්වන කුසලතා | | 05 |
| | මුළු ලකුණු | | 100 |

06. තෝරා ගන්නා ක්‍රමවේදය

සම්මුඛ පරීක්‍ෂණයෙන් ඉහළම ලකුණු ලබාගෙන ඇති කුසලතා අනුපිළිවෙළ අනුව හා මූලික සුදුසුකම් සපුරා ඇති අය තෝරා ගනු ලැබේ. අපේක්‍ෂකයන් කිහිප දෙනෙකුට එකම ලකුණු ලැබී ඇත්නම් තෝරා ගැනීම පිළිබඳ අවසාන තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

07. අයදුම්කිරීමේ ක්‍රමය :

පහත ආකෘතිය අනුව සකස් කරන ලද සියළුම අයදුම්පත් 2013.08.02 දින හෝ ඊට ප්‍රථම "ලේකම්, යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශය, "නිපුණතා පියස", අංක 354/2, ඇල්විටිගල මාවත, කොළඹ 05" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, අයදුම්පත් බහා එවන කවරයේ වම්පස සහකාර අධ්‍යක්‍ෂ (දෙපාර්තමේන්තුමය) තනතුර යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතුය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ලේකම්.

යෞවන කටයුතු හා නිපුණතා
සංවර්ධන අමාත්‍යාංශය,
"නිපුණතා පියස",
අංක 354/2, ඇල්විටිගල මාවත,
කොළඹ 05.

ආදර්ශ අයදුම් පත්‍රය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව යෞවන කටයුතු හා නිපුණතා සංවර්ධන අමාත්‍යාංශයේ කුඩා ව්‍යාපාර සංවර්ධන අංශයෙහි විධායක නිලධර ගණයේ සහකාර අධ්‍යක්‍ෂ (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා සීමිත බඳවා ගැනීම

01. සම්පූර්ණ නම :——————.

02. පෞද්ගලික ලිපිනය :——————.

03. රාජකාරි ලිපිනය :——————.

04. උපන් දිනය :——————.

05. ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි තනතුරට පත්වූ දිනය :——————.

06. ව්‍යවසායකත්ව සංවර්ධන පුහුණු නිලධාරි තනතුරට අදාළ කාර්යක්‍ෂමතා කඩඉම් පිළිබඳ විස්තර :

06.1 පළමුවන කාර්යක්‍ෂමතා කඩඉම සමත් වී තිබේද?

06.2 දෙවන කාර්යක්‍ෂමතා කඩඉම සමත් වී තිබේද?

......................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය බව ප්‍රකාශ කරමි.

————————,
අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය :

........................මයා/මිය/මෙය, මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරන බවත්, ඉල්ලුම්පත් කැඳවන දිනට පූර්වාසන්න වසර පහක කාලය තුළ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති බවත්, පූර්වාසන්න වසර පහ තුළ සියළුම වැටුප් වර්ධක උපයාගෙන ඇති බවත්, අවවාදයක් හැර වෙනත් විනය දඬුවමක් ලබා නොමැති බවත්, අංක 01 සිට 06 දක්වා සපයා ඇති තොරතුරු ඔහුගේ/ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි.

————————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන

නිල මුද්‍රාව

07–61

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කීට විද්‍යාඥ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කීට විද්‍යාඥ තනතුරට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ. පුරප්පාඩු සංඛ්‍යාව 28කි.

2. මෙම නිවේදනයේ "ලේකම්" යන පදයෙන් අදහස් කෙරෙන්නේ "රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්ය", "සේවය" යන පදයෙන් අදහස් කරන්නේ "ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයයි".

3. *ලිඛිත විභාගය*.-මෙම විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍ර වලින් සමන්විත වේ :-

1. බුද්ධි පරීක්‍ෂණය;
2. පොදු ප්‍රශ්න පත්‍රය.

4. *විභාග දිනය*.–මෙම විභාගය 2013 ඔක්තෝබර් මස කොළඹ දී පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම්ට බලය ඇත.

5. *වාචික පරීක්‍ෂණය*.–ලිඛිත විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍ර වලට පෙනී සිටි අයැදුම්කරුවන් අතරින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රමාණවත් බවට නියම කරනු ලබන ඉහළම මට්ටමක මුළු ලකුණු ප්‍රමාණයක් ලබාගත්තාවූ අපේක්‍ෂකයන් සම්බන්ධයෙන් සාමාන්‍ය සම්මුඛ පරීක්‍ෂණයක් පැවැත්වෙන දිනය ලේකම් විසින් තීරණය කරනු ඇත.

6. පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග අනුව තීරණය කරනු ලැබේ.

7. *සේවා කොන්දේසි*.–රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලටද, (ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 509/07 හා 1988 ජුනි මස 07 වන දිනැති *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද) විද්‍යාත්මක සේවා ව්‍යවස්ථාවේ පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතු කෙරෙන හෝ සංශෝධන වලටද යටත්ව තෝරාගනු ලබන අපේක්‍ෂකයකු සේවයේ II පන්තියේ II ශ්‍රේණියට පත්කරනු ලැබේ. ඒ අනුව මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. පරිවාස කාලය වසර 3කි. එම වසර 03 ඇතුළත I වැනි කාර්යක්‍ෂමතා කඩඉම සමත් විය යුතු අතර, පත්වීමේ දින සිට වස 06ක් ඇතුළත II වැනි කාර්යක්‍ෂමතා කඩඉම සමත් විය යුතු ය. තව ද පත්වීම ලැබ වසර 05ක් ගතවීමට පෙර 2007.05.28 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 පරිදි දෙවන රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවක් ලබාගත යුතු ය.

7.1 තමා වෙත පිරිනමන ලද තනතුරේ රාජකාරි නියමිත දිනයේ දී භාර ගැනීමට අපොහොසත් වන හා/හෝ පත්කරන ලද තනතුරක හෝ පත්කරන ලද ප්‍රදේශයක රාජකාරි භාර ගැනීම ප්‍රතික්ෂේප කරන හෝ මගහරින හෝ අයැදුම්කරුවන්ගේ පත්වීම අහෝසි කරනු ලැබීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත බලය ඇත.

8. *ව්‍යුහය හා මාසික වැටුප් පරිමාණය*.–2006.04.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006හි එස්. එල්. 1-2006 වැටුප් කාණ්ඩය අනුව,

SL I- රු. 22,935 - 10 x 645 - 8 x 790 - 17 x 1050 - රු. 53,555

මෙම විභාගය මගින් බඳවා ගැනීම් සිදු කරනුයේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණිය සඳහා වේ.

9. *සෞඛ්‍ය හා චරිතය*.–අපේක්‍ෂකයා සෞඛ්‍ය අතින් නිසි පරිදි සුදුසුකම් ලබා ඇති බවට ද විශිෂ්ට චරිතයකින් යුක්ත බවටද, ලේකම් සෑහීමකට පත්විය යුතු ය. ඔහු හොඳ ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට මනා ශාරීරික සෞඛ්‍යයකින් යුක්ත විය යුතු ය. තෝරාගනු ලබන අපේක්‍ෂකයන් වෛද්‍ය පරීක්‍ෂණයකට භාජනය කෙරෙනු ඇත.

10. *සුදුසුකම්*.– මේ සඳහා පෙනී සිටින අපේක්‍ෂකයකු,-

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය;

(ii) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියකු විය යුතු ය;

(iii.) උපාධිය බලපවත්නා දිනය හා මෙම නිවේදනය අනුව අවශ්‍ය සියලු සුදුසුකම්, අයැදුම්පත් කැඳවන අවසාන දිනට හෝ ඊට පෙර සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය;

(iv.) මෙම තනතුර සඳහා පහත සඳහන් පරිදි සුදුසුකම් සපුරා තිබිය යුතුය.:-

| *දෙපාර්තමේන්තුව* | *තනතුර* | *අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම්* |
|---|---|---|
| සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව | කීට විද්‍යාඥ | (අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කීට විද්‍යාව විෂයයක් වශයෙන් ඇතිව සත්ව විද්‍යාවෙන් විද්‍යාවේදී (විශේෂ) උපාධියක් ලබා තිබිය යුතුය;<br>හෝ<br>(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් කීට විද්‍යාව (පී. එච්. ඩී/එම්. එස්. සී./දර්ශනපති) උපාධිය ලබා තිබිය යුතු ය. |

(v.) අයැදුම්පත් භාරගන්නා අවසාන දිනට අවම වයස් සීමාව අවුරුදු 22ත් උපරිම වයස් සීමාව අවුරුදු 35ත් අතර විය යුතු ය. දැනටමත් රජයේ සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ;

(vi.) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරන කිසිදු තැනැත්තකුට මෙම විභාගය සඳහා පෙනී සිටීමට අවසර නොමැත.

11. *විභාග ගාස්තු.–* විභාගය සඳහා වූ ගාස්තුව රු. 1,000 කි. එය ඉල්ලුම්පත් භාර ගන්නා අවසන් දිනට පළමුව, විභාග දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂය වන 2003-02-13ට බැර වන පරිදි දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට ගෙවිය යුතු ය. අයැදුම්කරුවන්ගේ නමින්ම ගෙවා ලබාගන්නා ලදුපත ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවෙහි ඇලවිය යුතු ය. මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. ලදුපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය*

(අ) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 8 1/2" x 12" (A4) ප්‍රමාණයේ කඩදාසියක, ශීර්ෂ අංක 1.0 සිට 3.9 තෙක් පළමුවන පිටුවේද 3.10 සිට 6.0 තෙක් දෙවන පිටුවේද, ඉතිරිය තුන්වන පිටුවේද, වන පරිද්දෙන් සකස් කළ යුතු බව විශේෂයෙන් සැලකිය යුතු ය. ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව පිරවිය යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම් පත්‍රත්, දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක.) සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ දැක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයැදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයැදුම්පත ප්‍රතික්ෂේප විය හැක.

(ආ) අපේක්ෂකයා විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂාවෙන්ම ඉල්ලුම්පත්‍රය සම්පූර්ණ කළ යුතු ය. ඉල්ලුම් පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍ර වල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන්ද, දෙමළ ඉල්ලුම්පත්‍ර වල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන්ද, යෙදීම අත්‍යවශ්‍ය වේ.

(ඇ) සම්පූර්ණ කරන ලද විභාග ඉල්ලුම් පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් 2013 අගෝස්තු මස 05 දිනට හෝ එදිනට පෙර ලැබෙන පරිදි බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ (සංවිධාන හා විදේශ විභාග ශාඛාව), විභාග කොමසාරිස් ජනරාල් වෙතට එවිය යුතු ය. ඉල්ලුම් පත්‍රය බහා ඇති කවරයේ වමත් පස ඉහල කෙළවරෙහි පැහැදිළිව ''සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කීට විද්‍යාඥ තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2013" යන වචන පැහැදිලි ලෙස ලිවිය යුතු ය. එදිනට පසුව ලැබෙන කිසිම අයැදුම්පතක් භාරගනු නොලැබේ.

(ඈ) අයැදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සමාදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

(ඉ) ඉල්ලුම් පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම හෝ ගැන කිසිම පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

(ඊ) ඔබ විසින් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයැදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළකරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් හෝ ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් එහි සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතු ය. එසේ දැන්වීමේදී ඔබ ළඟ තබා ගත් අයැදුම්පත්‍රයේ, මුදල් ගෙවූ ලදුපතේ හා අයැදුම්පත ලියාපදිංචි තැපෑලෙන් යවා ලබාගත් කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් සමග ඔබගේ ඉල්ලීම් ලිපිය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමුකිරීම වඩාත් ඵලදායි වනු ඇත. ඔබ කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක්ද සඳහන් කරන්න. (විභාග දෙපාර්තමේන්තුවේ ෆැක්ස් අංකය - 0112784232).

13. *විභාගයට ඇතුළුවීම :*

(අ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් ඉදිරිපත් කරන අයැදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයකු විභාග මධ්‍යස්ථානයේ ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ. විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

(ආ) අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේදී නියමිත විභාග අංක යටතේ විභාගයට පෙනී සිටිය යුතු ය. සෑම අපේක්ෂකයකුම විභාගයේ පළමුවැනි දින, තම අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින, එහි ශාලාධිපති වෙත භාරදිය යුතු ය. සෑම අපේක්ෂකයකුම අනුගමනය කළ යුතු නීති මාලාවක් මෙම ගැසට් පත්‍රය

ආරම්භයේ පළ කර ඇත. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට හෝ සිදුවනු ඇත.

(ඇ) විභාගය ඉල්ලුම් කරන අවස්ථාව වන විට අයදුම්කරුවන්ගේ පැවති තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදාළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධයෙන් සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

*සටහන : අපේක්ෂකයකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ.*

14. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාව :*

තමා පෙනීසිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයකු විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතු ය. මේ සඳහා පහත සඳහන් ඕනෑම ලේඛනයක් පමණක් පිළිගනු ඇත. :-

(අ) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

15. *සාවද්‍ය තොරතුරු සැපයීමට දඬුවම්*

අපේක්ෂකයකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට කලින් හෝ විභාගය පවත්වන කාලයේදී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අපේක්ෂකයකු ඉදිරිපත් කර ඇති කිසියම් කරුණක් සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැත්නම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය ඕනෑකමින් යටපත් කර ඇත්නම් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

16. මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ උපදෙස්වලට යටත්ව ලේකම් තීරණය කරන පරිදි කටයුතු කරනු ඇත.

17. *විභාග ක්‍රමය හා විභාග මාධ්‍යය :*

(අ) විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි යන භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයකු විසින් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කරන ලද විභාග භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ආ) අපේක්ෂකයකු විභාගයට පෙනී සිටිය යුතු වන්නේ සුදුසුකම්ලත් උපාධිය ලබාගත් භාෂාවෙන්ම හෝ රාජ්‍ය භාෂාවෙන් විය යුතු ය.

(ඇ) අපේක්ෂකයකු සුදුසුකම් ලත් උපාධියේ විෂයයන්, භාෂා දෙකකින් හෝ වැඩි ගණනකින් හෝ සමත්වී ඇත්නම් එම උපාධියේදී ඔහු සමත්වූ විෂයයන්ගෙන් වැඩි ගණනකට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

(ඈ) ප්‍රධාන විෂය එක භාෂාවකිනුත්, අතිරේක විෂය තවත් භාෂාවකිනුත් සමත්වී ඇති විශේෂ උපාධියක් ඇති අපේක්ෂකයකු ප්‍රධාන විෂයයෙන් සාමාර්ථය ලත් භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ විභාගයට පෙනී සිටිය යුතු ය.

සටහන : (i) ඉහත (ආ) සහ (ඇ) හි ඇති "සුදුසුකම්ලත් උපාධිය" යන පදයෙන් අදහස් කෙරෙන්නේ 10 ඡේදයේ ඇති උපාධි සුදුසුකම වේ.

(ii) අපේක්ෂකයකු විභාගයේදී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතු ය.

(iii) අපේක්ෂකයකු විසින් ඉල්ලුම්පත්‍රයේ සඳහන් කරන ලද විභාග භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

18. *තෝරා ගැනීමේ ක්‍රමය* - පහත සඳහන් විෂයන්ගෙන් සමන්විත ලිඛිත පරීක්ෂණයක්,:-

| | | | |
|---|---|---|---|
| (i) | බුද්ධි පරීක්ෂණය | -කාලය පැය 01යි. | ලකුණු 100 යි |
| (ii) | පොදු ප්‍රශ්න පත්‍රය | -කාලය පැය 03යි. | ලකුණු 100 යි |

(මෙම විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40%)

19. බඳවා ගැනීමේ ක්‍රමය.—කීට විද්‍යාඥ තනතුරේ බඳවා ගැනීම් පරිපාටිය අනුව උක්ත තනතුර සඳහා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් තීරණය කරන පරිදි ඔහු වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් මගින් පවත්වනු ලබන ලිඛිත විභාගයක ප්‍රතිඵලවල කුසලතා අනුපිළිවෙල මත පමණක් බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සුදුසුකම් පරීක්ෂා කරනු ලැබේ. (සම්මුඛ පරීක්ෂණයට සහභාගීවීම පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.)

19.1 *ප්‍රතිඵල නිකුත් කිරීම*

විභාගයේ එක් එක් විෂයය සඳහා ලකුණු 40%ට නොඅඩුව ලබාගත් අපේක්ෂකයින්ගේ, පවතින පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නියම කරනු ලබන සංඛ්‍යාවක් ඇතුළත් මුළු ලකුණු ප්‍රමුඛතාවය අනුව සකස් කළ ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිසම වෙත ලබා දෙනු ඇත. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත එක් එක් විෂයය සඳහා ලබාගත් ලකුණු හා මුළු ලකුණු ඇතුළත් ප්‍රතිඵල ලේඛනයක් පෞද්ගලිකව ලබා දෙනු ඇත.

20. විෂයය නිර්දේශය

(i) බුද්ධි පරීක්ෂණය (කාලය පැය 1යි - ලකුණු 100යි)
අපේක්ෂකයාගේ තර්කන ශක්තිය, ගැටලු විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ කුසලතාව, විනිශ්චය කිරීම අරමුණු කරගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර, ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.

(ii) පොදු ප්‍රශ්න පත්‍රය (කාලය පැය 3යි - ලකුණු 100 යි)

සියළුම විෂයන් ආවරණය වන සේ පුළුල් විද්‍යාත්මක කරුණු සම්බන්ධයෙන් වූ ව්‍යුහගත ප්‍රශ්න වලින් සමන්විත වේ.

21. මෙම *ගැසට් නිවේදනයේ* සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝග පරිදි,

පී. බී. අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.

2013 ජුනි මස 19 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ II පන්තියේ II ශ්‍රේණියේ කීට විද්‍යාඥ තනතුරට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය (2013)

Open Competitive Examination for Recruitment to Grade II of Class II of the Post of Entomologist of Sri Lanka Scientific Service of the Department of Health — 2013

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

1. 0 මාධ්‍යය :

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

* ඉල්ලුම් පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.

2.0 අයදුම්කරන තනතුර :

| *දෙපාර්තමේන්තුව* | *තනතුර* |
|---|---|
| | |

3.0 පෞද්ගලික තොරතුරු :

3.1 මුල'කුරු අගට යොදා මුල'කුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :————.
උදාහරණ : RANASINGHE R. M. A. K.

3.2 සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්:————.

3.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.4 ජාතික හැඳුනුම්පත් අංකය

3.5 ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (මෙම ලිපිනයට විභාග ප්‍රවේශපත්‍ර තැපැල් කරනු ලැබේ.) :————.

3.6 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

3.7 තැපැල් නගරය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.8 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

3.9 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉ. දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.10 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1
විවාහක - 2
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.11 උපන් දිනය : වර්ෂය මාසය දිනය

3.12 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු මාස දින

4.0 සුදුසුකම් :

(i) උපාධිය ලද දිනය :————. (මෙම සුදුසුකම් ඇතිදැයි බැලීමට නිවේදනයේ 10 (iv) කරුණාකර හොඳින් කියවා බලන්න.)

| *විභාගය/උපාධිය* | *පන්තිය* | *වර්ෂය* | *විෂයන්* | *විශ්ව විද්‍යාල /ආයතන* |
|---|---|---|---|---|
| | | | | |

(ii) සාමාර්ථය ලබා ඇති උසස්ම විභාගය :- සිංහල :————.
දෙමළ :————.
ඉංග්‍රීසි :————.

(iii) පාසලෙන් අස්වූ පසු කළ රැකියා සහ/හෝ ලැබූ පුහුණුව පිළිබඳ විස්තර (සේවය භාර ගැනීමේ සහ අස්වීමේ දින සහ අස්වීමට හේතු සඳහන් කළ යුතුය.) :————.

(iv) දැනට දරන තනතුරේ විස්තර :
(*අ*) තනතුර :————.
(*ආ*) දෙපාර්තමේන්තුව/ආයතනය :————.

(ඇ) පත්වීමේ දිනය :————.

(ඈ) ස්ථිර/විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත/තාවකාලික ද යන වග :————.

(ඉ) තනතුරේ ස්ථිර කර තිබේ ද යන වග :————.

(ඊ) තනතුරේ වැටුප් පරිමාණය සහ දැනට ලබන වැටුප :————.

5.0 මුදල් කුවිතාන්සිය මනා ලෙස අලවන්න.

| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදු පතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) |
|---|

කුවිතාන්සි අංකය :————.

ගෙවන ලද කාර්යාලය :————.

දිනය :————.

6.0 යම්කිසි සාපරාධී වරදකට කෙදිනක හෝ උසාවියක දී වරදකරු වී ඇත්නම්, එම වරද හා ලැබූ දඬුවම පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

7.0 *අයදුම්කරුගේ සහතිකය ඃ*

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ............... හා ............... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග නීතිරීතිවලට අනුව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන්පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තව ද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුවද මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමට ද යටත් වන බවත්, එසේම විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

8.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (ගැසට් නිවේදනයේ 12(ඈ) පරිදි විය යුතුය) ඃ

මෙම ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරන ............................. (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් ............... දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන)

දිනය :————.

අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.

තනතුර :————.

ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතුය)

9.0 ඉල්ලුම්කරු රජයේ සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව

ඉහත 07 ඡේදයේ දී ඇති විස්තර නිවැරදි බවත්, පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බවත්, ඔහුගේ/ඇයගේ වැඩ සහ හැසිරීම ............... බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදාහැරිය හැකිය/නොහැකිය.

————,
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ
අත්සන.

තනතුර :————.
(නිල මුද්‍රාව මගින් සනාථ කල යුතුය)

දිනය :————.

07-86

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2013/2014

01. ගුරු විද්‍යාලයන්හි දැවුරුදු ගුරු පුහුණු පාඨමාලාව හැදෑරීම සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ගුරුවරුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් හෝ අධ්‍යාපන සේවා කමිටුවේ ලේකම් හෝ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් අත්සන් කළ විධිමත් පත්වීම් ලබා ඇති රජයේ පාසල්වල සේවය කරන නුපුහුණු ගුරුවරුන්,

1.2 අධ්‍යාපන අමාත්‍යාංශයේ පෞද්ගලික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සහතික කර ඇති පෞද්ගලික පාසල් නාම ලේඛනයේ ඇතුළත් හා පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති ගුරුවරුන්,

1.3 අධ්‍යාපන අමාත්‍යාංශයේ පිරිවෙන් අධ්‍යාපන අංශයේ ලියාපදිංචි පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ අනුමත කර ඇති පත්වීම් ඇති පිරිවෙන් ගුරුවරුන්,

1.4 මහරගම ජාතික අධ්‍යාපන ආයතනය විසින් ක්‍රියාත්මක කරනු ලැබූ දුරස්ථ, ප්‍රින්සෙට් හෝ උපාධිධාරී නොවන නුපුහුණු ගුරුවරුන් පුහුණු කිරීමේ ගුරු පුහුණු පාඨමාලාව හදාරා

අසාර්ථක වූ බව අදාළ ගුරු පුහුණු බලධාරීන් විසින් සහතික කර ඇති ගුරුවරුන්.

02. විශේෂ උපදෙස් :

2.1 ගුරු විද්‍යාලයන්හි පවතින පුරප්පාඩු මත පාසලේ වැඩ භාරගැනීමේ ජ්‍යෙෂ්ඨතාවය පදනම් කර ගෙන තෝරා ගැනීම් කෙරේ. ගුරු සේවයේ උසස්වීම්වල දී වෘත්තීය සුදුසුකම් නොමැතිවීම නිසා පාඩු සිදුවනවා පමණක් නොව පාසැල් අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනය ඇති කර ගැනීමට ද බාධාවක් වී ඇත. මෙහි සියලු කරුණු සලකා නුපුහුණු ගුරුවරුන් පුහුණුව ලබා ගැනීමට කටයුතු කළ යුතු වේ.

2.2 මෙම පාඨමාලාව අවුරුදු දෙකක නේවාසික පුහුණුවක් වන අතර, නේවාසික පහසුකම් නැති අවස්ථාවල විදුහල්පතිගේ ලිඛිත අවසරය මත ගුරු විදුහලට ආසන්නයේ නේවාසික වීමට අවසර දෙනු ලැබේ.

2.3 පාඨමාලා පැවැත්වීම සඳහා ඇති පහසුකම් අනුව පාඨමාලාව පැවැත්වෙන ගුරු විද්‍යාලය තීරණය වන බැවින් සැමවිටම ආසන්න ගුරු විද්‍යාලය ලබා දීමට නොහැකි වේ.

2.4 ගුරු විද්‍යාලයෙහි පුහුණු කාලය තුළ වෙනත් පාඨමාලා හැදෑරීම හෝ වෙනත් බාහිර විභාගවලට පෙනී සිටීම හෝ නොකළ යුතු ය. ඒ පිළිබඳ ලැබෙන තොරතුරු හා පාඨමාලා හැරයාම පිළිබඳ ව විධිමත් පරීක්ෂණයකින් පසු විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

2.5 මෙම පාඨමාලාව පහත දැක්වෙන ගුරුවරුන්ට අදාළ නොවේ.

(අ) කවර හෝ ගුරු විද්‍යාලයක දැනටමත් පුහුණුව ලබන්නා වූ හෝ පුහුණුව ලබා ඇති ගුරුවරුන්,

(ආ) උපාධිධාරි අභ්‍යාසලාභී ගුරු පත්වීම් හෝ උපාධිධාරි කළමනාකරණ සහායක පත්වීම් හෝ ඒ සමාන කවර හෝ උපාධි පත්වීමක් ලබා ඇති ගුරුවරුන්,

(ඇ) මෙහි අංක 07හි සඳහන් සුදුසුකම් සපුරා නොමැති ගුරුවරුන්,

ඉහත විස්තර අනුව සුදුසුකම් සපුරා නොමැති අය පාඨමාලාවට ඇතුළත් වී ඇති බව දැන ගැනීමට ලැබුණු අවස්ථාවක පුහුණුවන කාලය තුළ දී නම් පුහුණුව අවලංගු කරන අතර පුහුණුවෙන් පසුව නම් ඔහුගේ හෝ ඇයගේ ගුරු පුහුණු සහතිකය අවලංගු කරනු ලැබේ.

2.6 සෑම අයදුම්කරුවෙකු විසින් ම පහත සඳහන් ලියකියවිලි ගුරු පුහුණුව සඳහා ලියාපංදිංචි වීමට කැඳවන දිනයේ දී භාරදිය යුතු ය.

(අ) සම්පූර්ණ කරන ලද ඇප බැඳුම්කරය,

(ආ) ගුරු අධ්‍යාපන පාඨමාලා නිම කිරීමෙන් පසුව පත්කරනු ලබන පාසල්වල (රජයේ ගුරුවරුන් රජයේ පාසල්වල හා රජයේ නොවන ගුරුවරුන් අදාළ පාලක මණ්ඩලය යටතේ) නොකඩවා අවුරුදු 05 ක් සේවය කරන බවට රජය හෝ පාලක මණ්ඩලය සමග ඇති කරගත් ගිවිසුමක පිටපත,

2.7 1982 අප්‍රේල් මාසයෙන් පසුව දිස්ත්‍රික් සේවා ක්‍රමය යටතේ ගුරු පත්වීම් ලැබ පුහුණුවට ඇතුළත් වන අය ගුරු පුහුණුවෙන් පසුව ද මුල්පත්වීම ලද එම දිස්ත්‍රික්කවල ම සේවය කිරීමට යටත් වන බව ද සැලකිය යුතු ය,

2.8 ගුරු පුහුණු පාඨමාලාවක් සඳහා ගුරු විද්‍යාලයකට ඇතුළත් වූ පසු කිසිම පුහුණුලාභියෙකුට තම අභිමතය පරිදි පාඨමාලාවෙන් ඉවත්විය නොහැකි ය. එසේ ඉවත් වුවහොත් රජයේ වියදම් තක්සේරු කර අධිභාරය සමග අයකරනු ලැබේ,

03. (i) ගුරු විදුහල්පති විසින් අපේක්ෂා කරනු ලබන තත්ත්වයට නොපැමිණීම සාමාන්‍ය හැසිරීම ගුරු විද්‍යාලයේ විනය ගරුකත්වයට අනුකූල නොවන බව වැටහේ නම් හා ඉගෙනීම පිළිබඳ උද්‍යෝගීතාව දැක්වීමට අපොහොසත් වන්නේ නම් පුහුණුව ලබන්නන් පාඨමාලාව හැදෑරීමෙන් ඉවත් කරනු ලැබේ. පුහුණුව ලබන ගුරුවරයෙකුගේ පාඨමාලාවට සහභාගී වීම සහ පැමිණීම 80% ට අඩු වුවහොත් ගුරු විද්‍යාල අවසන් පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුස්සකු වනු ඇත. එහෙත් යම් අවස්ථාවක දී විශේෂ කාරණයක් මත අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

(ii) නිවාඩු :

ආයතනික පුහුණුව සඳහා වසර දෙකක සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු දෙනු ලැබේ. මෙම අධ්‍යයන නිවාඩු කාලය පුහුණු පාඨමාලාවේ හැදෑරීම සඳහා සම්පූර්ණයෙන් ම යොදා ගැනීම අවශ්‍ය ය. එහෙත් ගුරු පුහුණුව ලබන්නාට අත්‍යවශ්‍ය බවට විදුහල්පති සෑහීමකට පත්වේ නම් පමණක් සීමිත දින ගණනක් අනියම් නිවාඩු ලබා ගත හැකි ය. ඒ සඳහා විදුහල්පතිගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු බව අවධාරණය කරනු ලැබේ. මෙසේ ලබා ගන්නා නිවාඩුව වර්ෂයකට දින දහයක් නොඉක්ම විය යුතු ය.

අධික ලෙස නිවාඩු ගැනීමේ හේතුවෙන් පාඨමාලාව අධ්‍යයන කිරීමේ ප්‍රගතිය අසතුටුදායක බවට කිසියම් අභ්‍යාසලාභියෙකු පිළිබඳ ව විදුහල්පති වාර්තා කළහොත් පාඨමාලා අධ්‍යයනය අත්හිටුවා පාසල්වලට ආපසු යවනු ලැබේ. වෛද්‍ය නිවාඩු සඳහා රජයේ හෝ රජය පිළිගත් වෛද්‍යවරයෙකුගේ සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.

04. ගුරු විද්‍යාලය විසින් පවත්වනු ලබන පරීක්ෂණ වලින් සහ දෑවුරුදු ගුරු පුහුණු පාඨමාලාව සාර්ථකව නිම කිරීමෙන් පසු විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අවසාන පරීක්ෂණයෙන් ද සමත්වන අයට ගුරු පුහුණු සහතිකය පිරිනමනු ලැබේ.

05. වැටුප් පරිමාණය :

ගුරු සේවා ව්‍යවස්ථාවට අදාළව පසුකාලීන සංශෝධයන්ට යටත්ව පුහුණු ගුරුවරුන් ගුරු සේවයට අන්තර්ග්‍රහණය කළ පසු අදාළ වන වැටුප් පරිමාණයේ පිහිටුවනු ලැබේ.

06. (i) සෑම අයදුම්කරුවෙකු ම තමා පත්වීම් ලද විෂයෙන් ම ගුරු පුහුණුව ලැබිය යුතු ය. එහෙත් විශේෂ අධ්‍යාපන පාඨමාලාවට පමණක් වෙනත් විෂයයන්ගෙන් පත්වීම් ලද ගුරුවරුන්ටද ඉල්ලුම් කළ හැකි ය. රජයේ පත්වීම් ලද ගුරුවරුන්ගේ පත්වීම් විෂය, පත්වීම් ලිපියේ සඳහන් නොවන අවස්ථාවල දී තමා

අ.පො.ස. (උසස් පෙළ) විභාගයට පෙනී සිට සමත්වූ විෂයයන්ගෙන් ගුරු පුහුණුව ලබා ගැනීමට ඉල්ලුම් කළ හැකි ය. ඒ සඳහා අදාළ විෂයයන් උගන්වන බවට අනුමත කාලසටහනෙහි පිටපතක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය. අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සුදුසුකම් මත බඳවා ගත් අයගේ පත්වීම් ලිපියේ පත්වීම් විෂයය සඳහන් නොවන විටක දී එම පත්වීම ප්‍රාථමික ගුරු පත්වීමක් ලෙස සලකා කටයුතු කරනු ලැබේ. පෞද්ගලික හා පිරිවෙන් ගුරුවරුන්ගේ පත්වීම් ලිපිවල විෂයය සඳහන් නොවන අවස්ථාවල දී තමන් උගන්වනු ලබන විෂයය අනුව පුහුණුව සඳහා තෝරා ගැනේ. ආයතන ප්‍රධානියාගේ අත්සනින් යුත් අනුමත කාලසටහනේ පිටපතක් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) යම් පාඨමාලාවක් සඳහා අයදුම්කරුවන් ප්‍රමාණවත් පිරිසක් ඉල්ලුම් නොකළහොත් එම පාඨමාලාව පැවැත්වීම හෝ නොපැවැත්වීම පිළිබඳ ව අධ්‍යාපන ලේකම් විසින් තීරණය කරනු ලැබේ.

| | පාඨමාලාවේ අංකය | පාඨමාලාවේ නම |
|---|---|---|
| i. | 01 | සිංහල |
| ii. | 02 | ප්‍රාථමික අධ්‍යාපනය |
| iii. | 03 | සමාජ විද්‍යාව |
| iv. | 04 | විද්‍යාව |
| v. | 05 | ගණිතය |
| vi. | 06 | කෘෂි විද්‍යාව |
| vii. | 07 | ගෘහ විද්‍යාව |
| viii. | 08 | ඉංග්‍රීසි |
| ix. | 09 | බුද්ධ ධර්මය |
| x. | 10 | ක්‍රිස්තියානි/රෝමානු කතෝලික ධර්මය |
| xi. | 11 | හින්දු ධර්මය |
| xii. | 12 | ඉස්ලාම් ධර්මය |
| xiii. | 13 | චිත්‍ර කර්මය |
| xv. | 14 | සංගීතය |
| xvi. | 15 | නැටුම් |
| xvii. | 16 | අරාබි |
| xviii. | 17 | විශේෂ අධ්‍යාපනය |
| xix. | 18 | හස්ත කර්මාන්තය හා තාක්ෂණය |
| xx. | 19 | වාණිජ |
| xxi. | 20 | දෙමළ |
| xxi. | 21 | ශාරීරික අධ්‍යාපනය |
| xxii. | 22 | දෙවන බස (සිංහල/දෙමළ) |

07. (i) සුදුසුකම් :

සෑම අයදුම්කරුවෙකුට ම පහත සඳහන් සුදුසුකම් තිබිය යුතු ය.

(i) යහපත් චරිතයකින් යුක්ත විය යුතු ය.

(ii) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(iii) දෙවරකට නොවැඩි වාර ගණනක දී ගණිතය හා මව්බස ඇතුළුව විෂයයන් 06 කින් අ.පො.ස. (සා/පෙළ) හෝ ජා.පො.අ.ස. විභාගය සමත් වී සිටිය යුතු ය.

(iv) රජයේ පාසැල්වල සේවයේ නියුක්ත ගුරුවරුන් 2013.07.05 වැනි දින වන විට ගුරුවරයකු ලෙස අවම වශයෙන් මාස තුනක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතු ය.

(v) සෑම අයදුම්කරුවකු ම තම පත්වීමේ ස්වභාවය මුල් පත්වීම් ලිපිය ඇසුරෙන් සනාථ කළ යුතු ය.

(ii) පහත සඳහන් පාඨමාලා තෝරා ගන්නා අයට ඉහත කී සුදුසුකම්වලට අමතර ව මතු දැක්වෙන සුදුසුකම් ද තිබිය යුතු ය.

(අ) සිංහල පාඨමාලාව-
අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී සිංහල විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(ආ) විද්‍යා පාඨමාලාව-

(i) අ.පො.ස. (සා/පෙළ)පැරණි නිර්දේශයේ භෞතික විද්‍යාව, උද්භිද විද්‍යාව, ජීව විද්‍යාව, සත්ත්ව විද්‍යාව, රසායන විද්‍යාව, ගණිතය සහ විෂයයන්ගෙන් දෙකකටවත් සම්මාන සාමාර්ථය හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම. (උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව හෝ සමග ජීව විද්‍යාව ගණන් නොගැනේ.); *හෝ*

(ii) නව නිර්දේශයේ විද්‍යාව, ගණිතය විෂයයන් සමත්වීම හා විද්‍යාව සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

(iii) ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත් වීම.

(ඇ) ගණිතය පාඨමාලාව -

(i) අ.පො.ස. (සා/පෙළ) පැරණි නිර්දේශයේ හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී භෞතික විද්‍යාව, ව්‍යවහාරික ගණිතය, උසස් ගණිතය, මූලික ගණිතය, ශුද්ධ ගණිතය, ගණිතය, විද්‍යාව යන විෂයයන්ගෙන් යටත් පිරිසෙයින් දෙකකටවත් සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

(ii) අ.පො.ස. (සා/පෙළ) නව නිර්දේශයේ ගණිතය හා විද්‍යාව සමත්වීම හා ගණිතය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

(iii) ඉහත සඳහන් විෂයයන්ගෙන් අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී විෂයයන් දෙකකින් සමත්වීම.

(ඈ) කෘෂි විද්‍යා පාඨමාලාව -

(i) පැරණි නිර්දේශයේ අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

(ii) අ.පො.ස. (සා/පෙළ) නව නිර්දේශයේ විද්‍යාව හා කෘෂි විද්‍යාව සමත්වීම හා කෘෂි විද්‍යාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

(iii) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී කෘෂිකර්මය, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ත්ව විද්‍යාව යන විෂයයන්ගෙන් එකක් සමත් වී තිබීම; *හෝ*

(iv) ජා.පො. ආ. ස. විභාගයේ දී නම් ඉහත සඳහන් විෂයයකට ඒ හෝ බී සාමාර්ථයක් ලබා සිටීම. (ප්‍රාග් වෘත්තීය විෂයයක් නම්

විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි); *හෝ*

(v) කෘෂිකර්මය සම්බන්ධයෙන් රජයේ ගොවිපලක මාස 06 කට නොඅඩු කාලයක පුහුණුවක් ලබා තිබීම.

(ඉ) ගෘහ විද්‍යා පාඨමාලාව -

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගයේ දී හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ගෘහ විද්‍යාව, මැහුම් වැඩ යන විෂයන්ගෙන් එකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

(ii) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී ගෘහ විද්‍යාව විෂයය සමත්ව තිබීම; *හෝ*

(iii) ජා.පො.අ.ස. විභාගයේ දී ඉහත කී විෂයයන්ට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයයන් නම් විෂය මොනවාදැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි); *හෝ*

(iv) රජයේ කාර්මික විදුහලක වසරකට නොඅඩු කාලයක් ගෘහ විද්‍යාව හාදාරා ලබා ගත් සහතිකයක් තිබීම.

(ඊ) ඉංග්‍රීසි පාඨමාලාව -

(i) දැනට ඉංග්‍රීසි ගුරු පත්වීමක් ලබා තිබීම; *හෝ*

(ii) ඉංග්‍රීසි i, ii හෝ iii පෙළ ගුරු සහතික පත්‍රය ලබා දැනට සේවයේ යෙදී සිටීම; *සහ*

(iii) අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ ලන්ඩන් සාමාන්‍ය පෙළ විභාගයේ දී ඉංග්‍රීසි භාෂාවට හෝ ඉංග්‍රීසි සාහිත්‍යයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

(iv) ඊට උසස් විභාගයකින් ඉංග්‍රීසි විෂයය සමත්ව තිබීම.

(උ) ආගම පාඨමාලාව -

(i) බුද්ධ ධර්මය, රෝමානු කතෝලික ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය යන පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන අය තමා හැදෑරීමට බලාපොරොත්තු වන ආගම විෂයයට අ.පො.ස (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකපත්‍ර විභාගයේ දී සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

(ii) ජා.පො.අ.ස. විභාගයේ දී ආගම විෂයයට ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම; *හෝ*

(iii) ඉහත I හි සඳහන් විෂයයකින් හෝ ඊට අදාළ විෂයයකින් අ.පො.ස. (උ/පෙළ) විභාගයෙන් සාමාර්ථය ලබා තිබීම.

(ඌ) චිත්‍ර කර්ම පාඨමාලාව -

(i) රජයේ ලලිත කලායතනයේ සහතික පත්‍රය (චිත්‍ර කර්මය පිළිබඳ තුන් අවුරුදු පාඨමාලාව); හෝ

(ii) චිත්‍ර කර්ම (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ගුරු සහතික පත්‍රය; *හෝ*

(iii) අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී චිත්‍ර කර්ම විෂයය සඳහා සම්මාන සාමාර්ථය; *හෝ*

(iv) ජා.පො.අ.ස. විභාගයේ දී ඉහත චිත්‍ර කර්මය විෂයයට ඒ හෝ බී සාමාර්ථය ලබා තිබීම (සෞන්දර්යය විෂය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි); *හෝ*

(v) අ.පො.ස (උ/පෙළ) විභාගයේ දී චිත්‍ර කර්ම විෂයය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

(එ) සංගීත පාඨමාලාව -

(i) ලංකා ගාන්ධර්ව සභාවේ සංගීතය පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග සංගීත විභාගයේ හෝ ජාතික සංගීත විභාගයේ ප්‍රථම විභාගය; *හෝ*

(ii) රජයේ සංගීත විදුහලේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය; *හෝ,*

(iii) උත්තර ලංකා පෙරදිග සංගීත ගුරුවරුන්ගේ සංගමයේ සංගීතය පිළිබඳ සහතික පත්‍රය (5 වැනි ශ්‍රේණිය); *හෝ,*

(iv) පිළිගත් ඉන්දීය සංගීත ආයතනයක සංගීතය පිළිබඳ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය; *හෝ,*

(v) අ.පො.ස (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ සහතික පත්‍ර විභාගයේ දී සංගීතය විෂයයට සම්මාන සාමාර්ථයක්; *හෝ*

(vi) අ.පො.ස. (උ/පෙළ) විභාගයේ දී සංගීත විෂයයට සාමාර්ථයක්; *හෝ*

(vii) ජා.පො.අ.ස. විභාගයේ දී සංගීත විෂයයට ඒ හෝ බී සාමාර්ථ ලබා තිබීම (සෞන්දර්යය විෂයය කුමක්දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි).

(ඒ) නැටුම් පාඨමාලාව -

(i) ලංකා ගාන්ධර්ව සභාවේ නැටුම් පිළිබඳ අවසාන/මධ්‍යම සහතික පත්‍රය හෝ පෙරදිග නැටුම් විභාගයේ හෝ ජාතික නැටුම් විභාගයේ ප්‍රථම විභාගය; *හෝ,*

(ii) රජයේ නැටුම් විද්‍යාලයේ අන්තර් මාධ්‍ය සහතික පත්‍රය; හෝ

(iii) පිළිගත් ඉන්දීය නැටුම් ආයතනයක අන්තර් මාධ්‍ය සහතික පත්‍රය; *හෝ*

(iv) අ.පො.ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී නැටුම් විෂයය සඳහා සම්මාන සාමාර්ථය; *හෝ*

(v) අ.පො.ස. (උ/පෙ.)විභාගයේ දී නැටුම් විෂයය සඳහා සාමාර්ථයක්; *හෝ*

(vi) ජා. පො. අ. ස. විභාගයේ දී නැටුම් විෂයය සඳහා ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම (සෞන්දර්ය විෂයය කුමක් දැයි විදුහල්පති සහතික කළ ලිපියක් අවශ්‍යයි)

(ඔ) අරාබි පාඨමාලාව -

(i) විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන අල් ආලිම් ප්‍රාරම්භක පරීක්ෂණයේ I වැනි හා II වැනි පරීක්ෂණය සමත්වීම හෝ අ. පො. ස. (සා/පෙළ) විභාගයේ දී අරාබි විෂයයට සාමාර්ථයක් ලබා තිබීම; හෝ

(ii) පිළිගත් මද්රසා ආයතනයක අවසාන පරීක්ෂණයෙන් සමත්වීම.

මේ සඳහා මද්රසා ආයතන පහත සඳහන් වේ.

1. බහිජතුල් ඊබ්‍රාහිමියා අරාබි විදුහල, කොටුව, ගාල්ල
2. ගෆූරියා අරාබි විදුහල, මහරගම
3. මද්‍රසතුල් බාරි අරාබි විදුහල, වැලිගම
4. කාසිමියා අරාබි විදුහල, පුත්තලම
5. නද්වතුල් උලමා අරාබි විදුහල, මුත්තූර්
6. නැගෙනහිර ලංකා අරාබි විදුහල, ආඩ්ඩාලච්චේන
7. මදාසතුල්පුලා අරාබි විදුහල, කාත්තන්කුඩි
8. මුස්ලිම් කාන්තා අරාබි විදුහල, කල්එළිය
9. මද්‍රසතුල් ජාප්රියා අරාබි විදුහල, ගාල්ල
10. හිදාදියා අරාබි විදුහල, මාදම්පේ
11. නද්වතුල් බුහාරි අරාබි විදුහල, කින්නියා
12. මද්‍රසතුල් නූර්නියා අරාබි විදුහල, කොටුවේගොඩ, මාතර
13. මක්කියා අරාබි විදුහල, ගාල්ල

හෝ

වෙනත් පිළිගත් ආයතනයක් (සම්මුඛ පරීක්ෂණයේ දී පිළිගත් ආයතනයක් බවට සාක්ෂි ඉදිරිපත් කළ යුතු ය.)

(iii) ඉහත දැක්වෙන I හෝ II හි සඳහන් සුදුසුකම් සහිතව වෙනත් ගුරු පත්වීම් ලබා සිටින ගුරුවරුනට ද මෙම පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය.

(ඕ) විශේෂ අධ්‍යාපන පාඨමාලාව -

මෙම පාඨමාලාවේ අංශ තුනකි.

1. දෘශ්‍යාබාධිත (අන්ධ) ළමයින්ට ඉගැන්වීම
2. ශ්‍රවණාබාධිත (බිහිරි) ළමයින්ට ඉගැන්වීම
3. මන්ද මානසික (මන්ද බුද්ධික) ළමයින්ට ඉගැන්වීම

තමන් කැමති අංශය අයදුම්පතෙහි සඳහන් කළ යුතු ය. තෝරා ගැනීමේ දී ඉංග්‍රීසි දැනුම තිබෙන අය පිළිබඳව විශේෂ සැළකිල්ලක් දක්වනු ලැබේ.

(ක) හස්ත කර්මාන්ත හා තාක්ෂණ කුසලතා පාඨමාලාව-

(i) අ. පො. ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී,

ලී වැඩ
ලෝහ වැඩ
විවීම
මැටි ශිල්පය
මෝටර් කාර්මික ශිල්පය
ගුවන් විදුලි කාර්මික ශිල්පය
පෙදරේරු ශිල්පය යන විෂයයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

(ii) ජා. පො. අ. ස. විභාගයේ දී නම් අදාළ විෂයයෙන් ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම (ප්‍රාග් වෘත්තීය විෂයය කුමක් දැයි විදුහල්පතිගේ සහතිකයක් අවශ්‍යයි); හෝ

(iii) රජයේ කාර්මික විද්‍යාලයක හෝ රජයේ දෙපාර්තමේන්තුවක් යටතේ පවත්වන අවුරුද්දකට නොඅඩු පුහුණු පාඨමාලාවක් සාර්ථක ලෙස හදාරා ලබාගත් පුහුණු සහතිකයක් තිබීම

(ග) වාණිජ පාඨමාලාව-

(i) අ. පො. ස. (සා/පෙළ) හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී ආර්ථික විද්‍යාව, වාණිජ විද්‍යාව, ගණකාධිකරණය, යතුරු ලියනය, ලඝු ලේඛනය, වාණිජ්‍යය හා මූල්‍ය යන විෂයයන්ගෙන් දෙකකට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

(ii) අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී ඉහත සඳහන් විෂයයන් දෙකක් සමත්ව තිබීම; හෝ

(iii) රජයේ කාර්මික විද්‍යාලයක එක් අවුරුදු වාණිජ පාඨමාලා සහතිකය ලබා තිබීම.

(ජ) දෙමළ පාඨමාලාව -

(i) අ. පො. ස. (උ/පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.

(ට) ශාරීරික අධ්‍යාපන පාඨමාලාව -

(i) දැනට ශාරීරික අධ්‍යාපනය පිළිබඳ ගුරු පත්වීමක් ලබා තිබීම

(ඩ) සමාජ විද්‍යාව පාඨමාලාව -

(i) අ. පො. ස. (සා/පෙළ) විභාගයේදී හෝ ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී සමාජ අධ්‍යයනය විෂයයට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම; හෝ

(ii) ජා. පො. අ. ස. විභාගයේදී සමාජ අධ්‍යයනය විෂයයෙන් ඒ හෝ බී සාමාර්ථයක් ලබා තිබීම; හෝ

(iii) භූගෝල විද්‍යාව, ඉතිහාසය, ආර්ථික විද්‍යාව, දේශපාලන විද්‍යාව යන විෂයයන් අතුරින් අවම වශයෙන් විෂයයන් දෙකක් සඳහාවත් අ. පො. ස. (උ/පෙළ) විභාගයේදී සාමාර්ථයක් ලබා තිබිය යුතු ය.

(න) දෙවන බස (සිංහල/දෙමළ) පාඨමාලාව-

ඉහත 7 (1) හි සඳහන් සුදුසුකම් ඇති දෙවන බස (සිංහල/දෙමළ) විෂයය සඳහා පත්වීම් ලද ගුරුවරුන්ට මේ පාඨමාලාව සඳහා ඉල්ලුම් කළ හැකිය.

08. රජයේ අනුමත පෞද්ගලික පාසලක ස්ථිර ගුරු මණ්ඩලයක සේවයේ නියුක්ත සාමාන්‍ය පන්තිවල සතියකට පැය 20ක් ඉගැන්වීම් කරන ගුරු භවතුන් අතුරෙන් සීමිත සංඛ්‍යාවක් පුහුණුව සඳහා තෝරාගනු ලැබේ.

මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන පාසල් පෞද්ගලික පාසල් වශයෙන් සලකනු ලැබේ.

(i) 1951 වර්ෂයේ දී ගාස්තු අය කිරීමේ පාසල් බවට පත් වූ උපකෘත පාසල්,
(ii) 1960.12.01 වැනි දිනට ගාස්තු අය නොකරන පෞද්ගලික පාසල් බවට පත් වූ පාසල්,
(iii) අධ්‍යාපන අමාත්‍යාංශය විසින් (ප්‍රාදේශීය/පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ නොවේ.) අනුමත කර ඇති පෞද්ගලික පාසල් හා පිරිවෙන්.

සියලුම පෞද්ගලික පාසල්වල සේවය කරන අයදුම්කරුවන්ට 2013.07.05 වැනි දිනට අවම වශයෙන් අවුරුද්දක අඛණ්ඩ සේවයක් තිබිය යුතු අතර, ඔවුන්ගේ පළමු පත්වීමේ ලිපිය හා අදාළ ගුරුභවතා අනුමත ගුරු

මණ්ඩලයට අයත් බවට සහතික කරන ලද ලිපියක් අදාළ පළාත්/කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් ලබාගෙන සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට 2013.07.05 වැනි දිනට අවම වශයෙන් අවුරුදු දෙකක (02) සේවා කාලයක් තිබිය යුතු ය. 1959 පිරිවෙන් පනත හෝ 1979 අංක 64 දරන පනත යටතේ අනුමත සේවය මේ සඳහා ගණන් ගනු ලැබේ.

දැනට පිරිවෙන්වලින් ඉදිරිපත් වන ගුරු භවතුන්ට ඉල්ලුම් කළ හැක්කේ සිංහල, විද්‍යාව, ගණිතය, ඉංග්‍රීසි හා බුද්ධ ධර්මය යන පාඨමාලාවන්ට පමණි. (පත්වීම් ලද විෂයයෙන්ම ගුරු පුහුණුව ලැබිය යුතු ය.) විද්‍යායතන පිරිවෙන්වල උගන්වන අනුමත ගුරුවරුන්ට පමණක් මීට අමතරව සංගීතය, චිත්‍ර, නැටුම්, වාණිජ, ශාරීරික අධ්‍යාපනය සහ කෘෂි විද්‍යාව යන පාඨමාලා සඳහා ද ඉල්ලුම් කළ හැකි ය.

සියලුම රජයේ අනුමත පෞද්ගලික පාසල් ගුරුවරුන් පාලක මණ්ඩලයේ කළමනාකරුගෙන් ද පිරිවෙන් ගුරුවරුන් කෘත්‍යාධිකාරීගෙන් ද, පහත සඳහන් කරුණුවලට අදාළ ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

(i.) පුහුණුවන කාලයේ දී ගුරු භවතා සේවයෙන් නිදහස් කළ හැකි බවට,

(ii.) පුහුණුවන කාලය තුළ ගුරු භවතාට වැටුප් ගෙවන බවට,

(iii.) පුහුණුව අවසානයේ දී පාලක මණ්ඩලය විසින් අදාළ ගුරු භවතා නැවත සේවයේ යොදවා ගන්නා බවට,

(iv.) පුහුණුව සඳහා තෝරා ගන්නා පිරිවෙන් ගුරු භවතුන් වෙනුවට වෙනත් ගුරු භවතුන් නොඉල්ලන බවට හා ඔහුගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවට,

රජයේ අනුමත පෞද්ගලික පාසල් හා පිරිවෙන්වලින් තෝරා ගන්නා ගුරුවරුන් පුහුණුව සඳහා ලියාපදිංචි වීමට පෙර "පුහුණුවෙන් පසු රජයේ පාසල්වල රැකියා නොඉල්ලන බවට" පොරොන්දු පත්‍රයකට අත්සන් තැබිය යුතු ය.

රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් ඉදිරිපත් වන ගුරුවරුන් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් අත්සන් කළ මුල් පත්වීම් ලිපි ඉදිරිපත් කළ යුතු ය. වයස අවු. 18ට පෙර පත්වීම් ලබා සිටින ගුරුවරුන්ගේ පත්වීම් දිනය ගණන් ගැනෙනුයේ අවුරුදු 18 සම්පූර්ණ වූ දින සිට ය. වෙනත් නිලධාරියෙකු මෙම පත්වීම් ලිපිය අත්සන් කර ඇත්නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් සත්‍ය බවට සහතික කර තිබිය යුතු ය.

09. තෝරා ගැනීම සඳහා ඉල්ලුම් කිරීම

I. මෙම ගැසට් නිවේදනයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අපේක්ෂකයා විසින් පිළියෙල කරන ලද අයදුම්පතක් සම්පූර්ණ කොට එමගින් ඉල්ලුම් කළ යුතු ය.

(අ) ගුරු අධ්‍යාපන පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන මාධ්‍යයෙන් අයදුම් පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

(ආ) ආකෘති පත්‍රය 8" x 12" (A4) කඩදාසියක දෙපැත්තේ පිළියෙල කළ යුතු ය.

(ඇ) කිසිම කොටුවක් වෙනස් කිරීම හෝ ඉවත් කිරීම නොකළ යුතු ය. කොටු අතර ඉඩ ප්‍රමාණය සැලකිල්ලෙන් වෙන් කළ යුතු අතර එකිනෙකට ගොඩ ගැසෙන සේ පිළියෙල නොකළ යුතු ය.

II. අයදුම්කරු විසින් අයදුම්පත්‍රය නොඅඩුව හා නිවැරදි ව පිරවිය යුතු ය. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. පහත සඳහන් කරුණු කෙරෙහි අයදුම්කරුවන්ගේ අවධානය යොමු කරවනු ලැබේ.

(අ) සෑම අයදුම්කරුවකු ම තම නම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති පරිදි ම සඳහන් කළ යුතු ය.

(ආ) තම පාසලේ ප්‍රධානියා මගින් අයදුම් පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. පාසලේ ප්‍රධානියෙකු ඉල්ලුම් කරන්නේ නම් කොට්ඨාස/කලාප භාර අධ්‍යාපන අධ්‍යක්ෂ මගින් ඉදිරිපත් කළ යුතුය.

(ඇ) දක්වා ඇති උපදෙස් පරිදි පිළියෙල කරන ලද සියලුම අයදුම්පත්‍ර පහත දක්වා ඇති ආකෘතියේ පරිදි සකස් කරන ලද ලිපි කවරයක බහා එහි වම්පස ඉහළ කෙළවරේ "ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2013/2014" ලෙස ද පාඨමාලාව, මාධ්‍යය සහ කලාපය ද සඳහන් කර 2013.08.05 දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් "අධ්‍යාපන අධ්‍යක්ෂ, ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල" යන ලිපිනයට ලැබෙන සේ එවිය යුතුය.

ලියාපදිංචි තැපැල

"ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන
පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන්
තෝරා ගැනීම - 2013"

පාඨමාලාව :
මාධ්‍යය :
කලාපය :

අධ්‍යාපන අධ්‍යක්ෂ,
ගුරු අධ්‍යාපන පරිපාලන ශාඛාව,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

(ඊ) ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන අතර,

(i.) අයදුම්පත්‍රය ලැබුණු බවට දන්වනු නොලැබේ.

(ii.) අයදුම්පත්‍රයට සෙසු ලියවිලි අමුණා නොඑවිය යුතු ය.

(iii.) සුදුසුකම් පරීක්ෂා කිරීමට පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයේදී සියලු ම සහතික හා ලිපි ලේඛනවල මුල් පිටපත් සහ සහතික කළ ඡායා පිටපත් ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය.

III. "ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2013" පාඨමාලා සඳහා සතිඅන්ත හෝ දුරස්ථ පාඨමාලා නොපැවැත්වේ.

10. මෙම ගැසට් නිවේදනයෙහි සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2013 ජූලි මස 05 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

ආදර්ශ අයදුම් පත්‍රය

**අධ්‍යාපන අමාත්‍යාංශය**

***ගුරු විද්‍යාලයන්හි ගුරු අධ්‍යාපන පාඨමාලා හැදෑරීම සඳහා ගුරුවරුන් තෝරා ගැනීම - 2013/2014***

1. මාධ්‍යය : ☐

2. මුල් පත්වීමේ ලිපිය අනුව පාසලේ වැඩ භාරගත් දිනය : ☐

3. පාඨමාලාව : ☐

4. මුල් පත්වීමේ ස්වභාවය, විෂය සහ ඔබ අයත් වන සේවය/ශ්‍රේණිය

 (*a*) මුල් පත්වීමේ ස්වභාවය : ☐

 (*b*) විෂය : ☐

 (*c*) අයත් වන සේවය (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.)
 ශ්‍රී ලංකා ගුරු සේවය - 01
 ගුරු සහායක - 02 ☐ ☐
 වෙනත් (සඳහන් කරන්න) - 03

 (*d*) ශ්‍රේණිය : ☐

5. ඔබ දුරස්ථ හෝ සතිඅන්ත ගුරු පුහුණුව ලබා සම්පූර්ණ කර නැත්නම් පමණක් පහත විස්තර සපයන්න.

 (*a*) පාඨමාලාව :————.
 (*b*) වර්ෂය :————.
 (*c*) අවසාන විභාග ප්‍රතිඵලය :————.

6. මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න. අගට යෙදෙන නම මුලින් ලියා මුලකුරු දෙවනුව ලියන්න. උදා : PERERA, A. B.)
 Rev./Mr./Mrs./Ms. :————.

7. මුලකුරුවලින් දැක්වෙන නම් : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න.)
 ................................

8. ස්ත්‍රී/පුරුෂ භාවය (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.)

 පුරුෂ - 1 ස්ත්‍රී - 2 ☐

9. ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

10. උපන් දිනය (2013.07.05 වැනි දිනට වයස)
 අවුරුදු :————. මාස :————.දින :————.

11. දුරකථන අංකය : නිවස :————. ජංගම :————.

12. ඊ-මේල් ලිපිනය (ඇත්නම් ) :————.

13. පෞද්ගලික ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න) :——.

14. වර්තමාන සේවා ස්ථානය, ලිපිනය, දිස්ත්‍රික්කය සහ කලාපය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ලියන්න) :

 (i.) සේවා ස්ථානය :————.
 (ii.) ලිපිනය :————.
 (iii.) දිස්ත්‍රික්කය :————.
 (iv.) කලාපය :————.
 (v.) සේවා ස්ථානයේ ස්වභාවය (අදාළ අංකය ඉදිරිපස කොටුවේ ලියන්න.)

 (a) රජයේ පාසලකි - 01
 (b) වතු පාසල් - 02 ☐
 (c) රජයේ අනුමත පිරිවෙනකි - 03
 (d) රජයේ අනුමත පෞද්ගලික පාසලකි - 04
 (e) වෙනත් - 05

15. අධ්‍යාපන සුදුසුකම් :

(i.) අ. පො. ස. (සා/පෙළ) විභාග ප්‍රතිඵල :

| | | පළමුවර | දෙවනවර |
|---|---|---|---|
| | වර්ෂය | | |
| | විභාග අංකය | | |
| අනු අංකය | විෂයය | ලබාගත් ශ්‍රේණිය | |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |
| 5. | | | |
| 6. | | | |
| 7. | | | |
| 8. | | | |
| 9. | | | |
| 10. | | | |

(ii.) අ. පො. ස. (උ/පෙළ) විභාග ප්‍රතිඵල :

| | | පළමුවර | දෙවනවර |
|---|---|---|---|
| | වර්ෂය | | |
| | විභාග අංකය | | |
| අනු. අංකය | විෂයය | ලබාගත් ශ්‍රේණිය | |
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

16. සේවා විස්තරය :

| අනු. අංකය | සේවය කළ පාසල | සේවා කාලය | දුෂ්කර ද නැද්ද යන බව |
|---|---|---|---|
| 1. | | | |
| 2. | | | |
| 3. | | | |
| 4. | | | |

17. අයදුම්කරුගේ ප්‍රකාශය :

(i.) ඉහත දී ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. ම විසින් සපයා ඇති තොරතුරු අසත්‍ය බව අනාවරණය වුවහොත් පාඨමාලාවට තෝරා නොගන්නා බවත්, පාඨමාලාවට තෝරා ගැනීමෙන් පසු යම් තොරතුරක් අසත්‍ය බව අනාවරණය වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කිරීමට යටත් වන බවත් මෙයින් පිළිගනිමි.

(ii.) දැනට වෙනත් කිසිම ආයතනික ගුරු පුහුණුවකට සහභාගී නොවන බව ද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

18. විදුහල්පතිවරයාගේ නිර්දේශය

(i.) දැනට ගුරු මණ්ඩලයේ සිටින ගුරුවරුන්ගේ සංඛ්‍යාව :———

(ii.) ශිෂ්‍ය සංඛ්‍යාව :————.

(iii.) අයදුම්කරු ගුරු පුහුණුව සඳහා නිදහස් කළහොත් ශිෂ්‍ය සංඛ්‍යාව අනුව පාසලේ සිටින ගුරු හවතුන් සංඛ්‍යාව ප්‍රමාණවත් ද? :——

ඉහත අයදුම්කරු මාගේ පාසලේ ……… දින සිට ගුරු සේවයේ/ගුරු සහායක ලෙස සේවය කරන බවත්, අයදුම්කරු ඉහත දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, මෙයින් සහතික කරමි.

ගුරු පුහුණුව සඳහා……… හිමි/මයා/මිය/මෙනවිය තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට ද එකඟ වෙමි.

————,
විදුහල්පතිගේ අත්සන,
සහ නිල මුද්‍රාව.

දිනය :————.

19. ……………………………… හිමි/මයා/මිය/මෙනවිය ……… කලාපයේ ……………… විද්‍යාලයේ ගුරු සේවයේ/ගුරු සහායක ලෙස සේවයේ නියුතු බවත්, ඔහු/ඇය ……………… දිනැති මුල් පත්වීම අනුව ……… දින වැඩ භාරගෙන ඇති බවත්, ……… දින සිට මේ දක්වා මෙම පාසලේ සේවය කරන බවත්, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර මවිසින් පරීක්ෂා කර බලන ලදුව සත්‍ය බවත් සහතික කරමි.

ගුරු පුහුණුව සඳහා ……………………… හිමි/ මයා/ මිය/මෙනවිය තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට ද එකඟ වෙමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන
සහ නිල මුද්‍රාව.

දිනය :————.

20. ……………………………… හිමි/මයා/මිය/මෙනවිය ……… කලාපයේ ……………… විද්‍යාලයේ ගුරු සේවයේ/ගුරු සහායක ලෙස සේවය කරන බව ද, මෙම ඉල්ලුම් පත්‍රයේ සඳහන් විස්තර මවිසින් පරීක්ෂා කර බලන ලදුව සත්‍ය බවත් සහතික කරමි.

ගුරු පුහුණුව සඳහා ……………… හිමි/මයා/මිය/මෙනවිය තෝරා ගනු ලැබුවහොත් ඒ සඳහා නිදහස් කිරීමට ද එකඟ වෙමි.

————,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අත්සන,
සහ නිල මුද්‍රාව.

දිනය :————.

07-21/1

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 2014 අධ්‍යයන වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගැනීම

2014 අධ්‍යයන වර්ෂය තුළ දී පැවැත්වෙන එක් අවුරුදු පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීමට තෝරා ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

02. මෙම පාඨමාලාව කොළඹ, පේරාදෙණිය සහ යාපනය යන විශ්වවිද්‍යාලවල පැවැත්වේ.

03. එක් එක් විශ්වවිද්‍යාලයේ ඉගැන්වීම් කරන භාෂා මාධ්‍යයන් පහත දක්වා ඇති අතර පාඨමාලාව සඳහා එක් භාෂා මාධ්‍යයකින් පමණක් අයදුම් කළ හැකි ය.

1. කොළඹ විශ්ව විද්‍යාලය - සිංහල සහ දෙමළ මාධ්‍යය,
2. පේරාදෙණිය විශ්වවිද්‍යාලය - සිංහල මාධ්‍යය,
3. යාපනය විශ්වවිද්‍යාලය - දෙමළ මාධ්‍යය

04. සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇය පහත සඳහන් සුදුසුකම් ඇත්තෙකු බව තහවුරු කළ යුතු ය.

(i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියෙකු වීම;
(ii) 2013.08.05 දිනට වයස අවුරුදු 50ට නොවැඩි වීම;
(iii) මනා කායික හා මානසික සෞඛ්‍යයකින් සහ යහපත් චරිතයකින් යුක්තවීම;
(iv) පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධිධාරියෙකු වීම;
(v) පහත දැක්වෙන සේවාවලට අදාළ තනතුරක ස්ථිර පත්වීමක් ලබා සේවය කිරීම.

(අ) *ශ්‍රී ලංකා ගුරු සේවය
*ශ්‍රී ලංකා පෞද්ගලික පාසල් ගුරු සේවය
*ශ්‍රී ලංකා පරිවෙනාචාර්ය සේවය
(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවය
(ඇ) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය
(ඉ) ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවය

(vi) 2013.08.05 වැනි දිනට අංක 04 (v) හි දක්වා ඇති සේවාවකට අයත් තනතුරක උපාධිධාරියකු ලෙස අවුරුද්දක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

*සැලකිය යුතුයි.-* 1. ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පත්වීම් ලබා ඇති ගුරුවරුන් 2013.08.05 වැනි දිනට තම පත්වීමේ බැඳුම්කරයේ කාලසීමාව වන අනිවාර්ය පස් අවුරුදු සේවා කාලය සම්පූර්ණවී තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබනු ඇත.

2. අධ්‍යයන නිවාඩු ලබා බැඳුම්කරයට යටත්ව සිටින අයදුම්කරුවන් 2013.08.05 වැනි දිනට බැඳුම්කරයේ සඳහන් අනිවාර්ය සේවා කාලය අවසන් කළ හෝ එසේ නොමැති නම් ඉන් අවුරුදු පහක්වත් (05) සම්පූර්ණ කර තිබේ නම් පමණක් අයදුම් කිරීමට සුදුසුකම් ලබති.

3. අධ්‍යාපනවේදී උපාධිධාරීන්ට මෙම පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කළ නොහැකි ය.

05.1 තෝරා ගැනීමේ පිළිවෙල :

(i) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

(ii) අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ලකුණු අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

(iii) *ගැසට් නිවේදනයේ* අංක 04 (v) හි අයදුම්කරු අයත් වන සේවාවට අදාළ තනතුරෙහි සේවා කාලය සඳහා සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු පිරිනැමීම සිදු කෙරෙනු ඇත. සේවා කාලය එක් අවුරුද්දකට ලකුණු 04 බැගින් පිරිනැමේ. සේවා කාලය සඳහා ලබාදෙන උපරිම ලකුණු ප්‍රමාණය 40 කි. අයදුම්කරුවකුගේ සේවා කාලය ගණනය කරන්නේ ඔහු/ඇය අදාළ තනතුරේ වැඩ භාරගත් දිනයේ සිට ය.

(iv) ලිඛිත පරීක්ෂණයේ ලකුණු හා සේවා කාලය සඳහා ලැබෙන ලකුණුවල එකතුව අවසාන ලකුණ සේ සලකා එම ලකුණු අනුපිළිවෙල අනුව පාඨමාලාව සඳහා තෝරා ගැනීම සිදු කෙරෙනු ඇත.

(v) දුබලතා සහිත අයදුම්කරුවන් අයදුම් කළහොත් පාඨමාලාවට තෝරාගනු ලබන සංඛ්‍යාවෙන් 1%ක් ඔවුන් සඳහා වෙන් කරනු ලැබේ.

(vi) පාඨමාලාව හැදෑරීම සඳහා තෝරා ලබන සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලයේ තිබෙන ඉඩකඩ ප්‍රමාණය අනුව තීරණය වනු ඇත.

05.2 ලිඛිත පරීක්ෂණය :

(i) විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන තෝරා ගැනීමේ ලිඛිත පරීක්ෂණය සිංහල හා දෙමළ යන භාෂා මාධ්‍ය දෙකෙන් කොළඹ හා යාපනය යන නගරවල දී පැවැත්වේ.

(ii) ඉහත සඳහන් මධ්‍යස්ථාන දෙක අතරින් තමා ඉල්ලුම් කළ මධ්‍යස්ථානයේ දී ඉල්ලුම් කළ මාධ්‍යයෙන් ලිඛිත පරීක්ෂණයට පෙනී සිටිය හැකි ය. අයදුම්කරන ලද විභාග මධ්‍යස්ථානය පසුව වෙනස් කරනු නොලැබේ.

(iii) විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාගය පැවැත්වීම පිළිබඳව ප්‍රකාශ කොට ඇති නීතිරීතිවලට අනුකූලව විභාග අපේක්ෂකයන් විසින් කටයුතු කළ යුතු ය.

(iv) ලිඛිත පරීක්ෂණය ප්‍රශ්නපත්‍ර දෙකකින් සමන්විත ය.
  (අ) සාමාන්‍ය දැනීම:-
  කාලීන තොරතුරු, සාමාන්‍ය දැනීම, අධ්‍යාපනික තොරතුරු හා ගැටලු පිළිබඳ ප්‍රශ්න පත්‍රය (කාලය පැය 01)
  (ආ) අභියෝග්‍යතාවය :-
  භාෂා හැකියාව, අවබෝධය, තර්කනය හා සංඛ්‍යානමය කුසලතා පිළිබඳ ප්‍රශ්න පත්‍රය (කාලය පැ. 01 යි මිනිත්තු 30යි)

05.3 සම්මුඛ පරීක්ෂණය :

(i) සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින් විසින් *ගැසට් නිවේදනයේ* 04 වැනි ඡේදය අනුව තමන් පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බව තහවුරු කළ යුතු ය.

(ii) අපේක්ෂකයින් විසින් *ගැසට් නිවේදනයේ* 04 (v) හි ආදළ තනතුරෙහි/තනතුරුවල සේවා කාලය තහවුරු කිරීමට නියමිත ලිපිලේඛන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය. විශේෂයෙන්ම තනතුරෙහි වැඩ භාරගත් දිනය සම්මුඛ පරීක්ෂණයේ දී තහවුරු කළ යුතුය. එය අපේක්ෂකයාට සේවා කාලය සඳහා නියමිත ලකුණ ලබා ගැනීමට උපකාර වනු ඇත.

(iii) පිරිවෙන් සහ රජයේ අනුමත පෞද්ගලික පාසල්වලින් පාඨමාලාව සඳහා ඉල්ලුම් කරන ගුරුභවතුන්, –

  (අ) පාඨමාලාව සඳහා නිදහස් කරන බවටත්,
  (ආ) පාඨමාලාව හදාරන කාලය තුළ වැටුප් ගෙවන බවටත්,
  (ඇ) පාඨමාලාව අවසානයේ ගුරුභවතා නැවත සේවයට යොදාගන්නා බවටත්,
  (ඈ) අදාළ ගුරුභවතාගේ අධ්‍යයන කාලය තුළ ඔහු/ඇය ගේ පුරප්පාඩුවට වෙනත් ගුරුවරයෙකු බඳවා නොගන්නා බවටත්,
  (ඉ) ගුරුභවතාගේ වැඩ කොටස අනුමත ගුරු මණ්ඩලය අතර බෙදා දෙන බවටත්, ආයතනයේ කෘත්‍යාධිකාරී/පාලක මණ්ඩල කළමණාකරු විසින් සහතික කරන ලද ප්‍රකාශ පත්‍රයක් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

06. අයදුම්පත් ඉදිරිපත් කළයුතු ආකාරය :

(i) දී ඇති ආදර්ශ ආකෘතිපත්‍රය අනුව A4 ප්‍රමාණයේ කඩදාසියේ දෙපස භාවිතා කරමින් අයදුම්පත් පිළියෙල කළ යුතු ය.

(ii) දෘෂ්‍යාබාධිත/ශ්‍රව්‍යාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවන් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන අයදුම්පත්වල වම්පස උඩ කෙළවරේ රතු පාටින් "දෘෂ්‍යාබාධිත/ශ්‍රව්‍යාබාධිත/වෙනත් විශේෂ අවශ්‍යතා ඇති අයදුම්කරුවෙකි." යනුවෙන් සඳහන් කළ යුතු ය.

(iii) විභාග ගාස්තු ගෙවීම :
විභාග ගාස්තු වශයෙන් රු. 750ක මුදලක් ළගම ඇති තැපැල් කාර්යාලයට ගෙවා ලබාගත් කුවිතාන්සිය අයදුම්පතෙහි ඒ සඳහා ඇති කොටුවෙහි අලවන්න.

2013.07.05 සිට 2013.08.05 දින දක්වා සියලුම තැපැල් කාර්යාලයන්හි මෙම කුවිතාන්සිය නිකුත් කිරීම සඳහා විධිවිධාන යොදන ලෙස විභාග දෙපාර්තමේන්තුව විසින් තැපැල්පති වෙත දන්වා යවනු ඇත.

(iv) අයදුම්පත් එවීම :

  (අ) අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස උඩ කෙළවරේ "පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර) පූර්ණ කාලීන පාඨමාලාව - 2014" යනුවෙන් සඳහන් කළ යුතු ය.

  (ආ) 2013.08.05 දින හෝ ඊට පෙර ලැබෙන සේ "විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව, ඇගයීම් සහ තක්සේරු සේවාව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් අයදුම්පත් එවිය යුතු වේ.

(ඇ) ඉදිරිපත් කරන අයදුම්පතෙහි පිටපතක් අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට ආයතන ප්‍රධානියා මගින් භාරදිය යුතුවේ. එය පාඨමාලාව සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් ඔහුට/ඇයට අධ්‍යයන නිවාඩු ලබාගැනීමේ දී උපකාරී වනු ඇත.

(v) කාලසටහන් හා ප්‍රවේශපත්‍ර විභාග අපේක්ෂකයින් වෙත තැපැල් මගින් නිකුත් කරන අතර තම ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනට අවම වශයෙන් දින 07කට පෙර නොලැබුනහොත් "විභාග කොමසාරිස් ජනරාල්, විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල" යන ලිපිනයට පහත සඳහන් තොරතුරු සහිතව දැන්විය යුතු වේ.

(අ) විභාගයේ නම :—————.
(ආ) විභාග අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :—————.
(ඇ) ලිපිනය :—————.
(ඈ) මුදල් ගෙවන ලද තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :—————.
(ඉ) ඉල්ලුම්පත තැපැල් කළ දිනය :—————.
(ඊ) ඉල්ලුම්පත තැපැල් කළ තැපැල් කාර්යාලය හා ලදුපත් අංකය :—————.

(vi) කිසිදු හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු භාරදීම හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීම කරනු නොලැබේ.

(vii) අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(viii) සෑම අයදුම්කරුවෙකුම ලිඛිත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව, වලංගු හඳුනා ගැනීමේ පත්‍රයක් මගින් තහවුරු කළ යුතු ය.

(ix) අදාළ පාඨමාලාව හැදෑරීමට අයදුම්කරුවකු යම් විශ්වවිද්‍යාලයකට තෝරා ගැනීමෙන් පසු විශ්වවිද්‍යාලය මාරු කිරීමට අවසර දෙනු නොලැබේ.

(x) තෝරාගැනීමෙන් පසුව වුව ද ගැසට් නිවේදනයට අනුව අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති බව පෙනී යන්නේ නම් එවැනි අපේක්ෂකයකුගේ තෝරා ගැනීම අවලංගු කිරීමට සිදුවේ.

07. අධ්‍යයන නිවාඩු :

තෝරාගනු ලැබූ අයදුම්කරුවන්ට පාඨමාලාව හැදෑරීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ නිලධාරීන්, ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන් සහ ජාතික පාසල්, පෞද්ගලික පාසල් සහ පිරිවෙන්වල සේවයේ නියුක්ත ගුරුවරුන් අධ්‍යයන නිවාඩු අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වෙතින් ද සෙසු අයදුම්කරුවන් අධ්‍යයන නිවාඩු අදාළ පළාතේ අධ්‍යාපන ලේකම් වෙතින් ද අනුමත කර ගත යුතු වේ.

08. බැඳුම්කරය :

පාඨමාලාවට තෝරාගනු ලැබූ අයදුම්කරුවන් විසින් පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමෙන් පසු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ නීති රීති අනුව නියමිත කාල පරිච්ඡේදයක් ඔහු/ඇය දෙපාර්තමේන්තුවේ සේවය කරන බවට අධ්‍යාපන ලේකම්/පළාත් අධ්‍යාපන ලේකම් සමඟ ඇප බැඳුම්කරයකට අත්සන් කළ යුතු වේ.

09. තෝරාගනු ලැබූ අයදුම්කරුවකු පාලනය කර ගත හැකි හේතූන් මත පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ නොකර නියමිත කාලසීමාව ඇතුළත දී ඩිප්ලෝමා සහතිකය ලබා ගැනීමට අපොහොසත් වූයේ නම්, එම අධ්‍යයන නිවාඩු කාලය තුළ ඔහුට/ඇයට ගෙවන ලද සම්පූර්ණ වැටුප් හා දීමනා ආපසු ගෙවිය යුතු වේ.

10. පාඨමාලාව හදාරන කාලය තුළ දී ශිෂ්‍යයින්ගේ වැඩ, හැසිරීම හා පැමිණීම අසතුටුදායක බව පෙනී ගියහොත් ඔවුන් පාඨමාලාවෙන් ඉවත් කරනු ඇත.

11. මෙම ගැසට් නිවේදනයෙහි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇතිවුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්වෙනු ඇත.

එස්. එම්. ගෝඨාභය ජයරත්න,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2013 ජූලි මස 05 වැනි දින,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
බත්තරමුල්ල.

*ආදර්ශ අයදුම්පත*

*2014 වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (අභ්‍යන්තර)*
*පූර්ණකාලීන පාඨමාලාව හැදෑරීම සඳහා ඉල්ලුම් කිරීම*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

| ඉල්ලුම් කරන මාධ්‍යය (සිංහල/දෙමළ) | ඉල්ලුම් කරන විභාග මධ්‍යස්ථානය (කොළඹ/යාපනය) | ඉල්ලුම් කරන විශ්ව විද්‍යාලය (කොළඹ/යාපනය/පේරාදෙණිය) |
|---|---|---|
| | | 01 |
| | | 02 |

01. (i) මුලකුරු සමඟ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් (වාසගම ඉදිරියෙන්) :————.
උදා. : Mr. SILVA, A. B. C.

(ii) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

02. (i) (අ) රාජකාරී ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) රාජකාරී දුරකථන අංකය :————.

(ii) (අ) පෞද්ගලික ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ආ) පෞද්ගලික දුරකථන අංකය :————.

(iii) සේවය කරන පාසලේ/ආයතනයේ පිහිටීම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :

| පළාත | දිස්ත්‍රික්කය | කලාපය |
|---|---|---|
| | | |

(iv) ආයතනයේ ස්වභාවය (රජයේ පාසල්/පෞද්ගලික පාසල්/පිරිවෙන්/වෙනත්) : :————.

03 (i) උපන් දිනය : අවුරුද්ද :————. මාසය :————. දිනය :————.

(ii) 2013.08.05 වැනි දිනට වයස : අවුරුදු :————. මාස :————. දින :————.

(iii) ස්ත්‍රී පුරුෂ භාවය :————.

04. *උපාධිය පිළිබඳ විස්තර :*

| උපාධිය | විශ්ව විද්‍යාලයේ පාඨමාලාව හැදෑරූ කාලය ( .........සිට ......... දක්වා) | උපාධිය සමත් වූ වසර | උපාධිය වලංගු දිනය | උපාධි විෂයයන් | සාමාර්ථයේ ස්වභාවය | ආයතනය/ විශ්ව විද්‍යාලය | උපාධිය (අභ්‍යන්තර/ බාහිර) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |

05. (i) (අ) ශ්‍රී ලංකා ගුරු සේවයට පත් වූ දිනය :————.
(ආ) ශ්‍රී ලංකා ගුරු සේවයේ වැඩ භාරගත් දිනය :————.
(ඇ) දැනට දරන තනතුර :————.

(ii) (අ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයට/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයට/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයට පත් වූ දිනය :————.
(ආ) ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ වැඩ භාරගත් දිනය :—.

(iii) උපාධියෙන් පසු 2013.08.05 වැනි දිනට ශ්‍රී ලංකා ගුරු සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සේවා කාලය :————.

(iv) 2013.08.05 වැනි දිනට ශ්‍රී ලංකා ගුරු සේවයේ/ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ/ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ/ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ සම්පූර්ණ සේවා කාලය :————.

06. *වෘත්තීය පුහුණුව පිළිබඳ විස්තර :*

| *පාඨමාලාව හැදෑරූ ආයතනය (ගුරු විද්‍යාලය/ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය හෝ වෙනත්)* | *පාඨමාලාව (විෂය ක්ෂේත්‍රය* | *ආයතනයේ පාඨමාලාව හැදෑරූ කාල සීමාව* | |
|---|---|---|---|
| | | *දින සිට* | *දින දක්වා* |
| | | | |

07. *ලබාගත් අධ්‍යයන නිවාඩු පිළිබඳ විස්තර :*

| *අධ්‍යයන නිවාඩු ලබාගත් කාරණය* | *බැඳුම්කර කාලය . . . දින සිට . . දින දක්වා* | *බැඳුම්කරය සම්පූර්ණ කිරීමට ඉදිරියට ඇති කාලය* |
|---|---|---|
| | | |

***සටහන.***-ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ කාලසීමාව අධ්‍යයන නිවාඩුවක් ලෙස නොසැලකේ.

08. (අ) ඉල්ලුම්කරුට විරුද්ධව විනයානුකූල පරීක්ෂණයක් පවතී ද? ඔව්/නැත.

(ආ) පවතී නම් ඒ සම්බන්ධ තොරතුරු :

09.

| | |
|---|---|
| තැපැල් කාර්යාලයට මුදල් ගෙවා ලබාගත් කුවිතාන්සිය මෙහි අලවන්න. | කුවිතාන්සි අංකය :<br>දිනය :<br><br>………………………. තැපැල්/උප තැපැල් කාර්යාලයට<br>රු. ………………………………………. (මුදල අකුරෙන්)<br>ගෙවන ලද බවට සහතික කරමි.<br><br>අයදුම්කරුගේ අත්සන :————.<br><br>දිනය :————. |

10. *අයදුම්කරුගේ ප්‍රකාශය :*

මෙම ඉල්ලුම්පත්‍රයේ දක්වා ඇති සියලුම තොරතුරු නිවැරදි හා සත්‍ය බවට ද, 2013.07.05 වැනි දින ගැසට් නිවේදනයේ 04 වැනි ඡේදය අනුව මා මෙම පාඨමාලාව හැදෑරීමට සුදුසුකම් ලබා ඇති බවටද, විභාග පනතේ අයදුම්කරුවන් සඳහා වූ නීතිරීතිවලට එකඟව කටයුතු කරන බවටද නියමිත විභාග ගාස්තු ගෙවා වලංගු කුවිතාන්සියක් අමුණා ඇති බවටද මෙයින් සහතික වෙමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11. *පාඨමාලාව සඳහා ආයතනයෙන් නිදහස් කිරීම පිළිබඳ නිර්දේශය :*

(විදුහල්පති, පීඨාධිපති, කෘත්‍යාධිකාරී, පාලක මණ්ඩලයේ කළමණාකරු හෝ දෙපාර්තමේන්තු ප්‍රධානියා)

පාඨමාලව හැදෑරීම සඳහා තෝරා ගනු ලැබුවහොත් වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරීමේ අවශ්‍යතාවය සලකාබලා මෙම අයදුම්කරු නිදහස් කරමි/නොකරමි.

————,
විදුහල්පතිගේ/ආයතන ප්‍රධානියාගේ අත්සන හා නිල මුද්‍රාව.

දිනය :————.

12. පාඨමාලාව සඳහා ගුරුභවතා නිදහස් කිරීම පිළිබඳ කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂගේ නිර්දේශය :

උක්ත නම් සඳහන් අයදුම්කරු පාඨමාලාව හැදෑරීම සඳහා තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා අධ්‍යයන නිවාඩු ලබාදීම නිර්දේශ කරමි.

————,
කලාප අධ්‍යාපන අධ්‍යක්‍ෂ,
(අත්සන හා නිල මුද්‍රාව.)

දිනය :————.

07-21/2

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. ශ. |
|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට ... ... ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* රු. ශ. | *තැපැල් ගාස්තුව* රු. ශ. |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු සහ පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** *රු. ශ.* | **තැපැල් ගාස්තුව** *රු. ශ.* |
|---|---|---|
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනිපිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2013** | | | |
| ජූලි | 2013.07.05 | සිකුරාදා | 2013.06.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.12 | සිකුරාදා | 2013.06.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.19 | සිකුරාදා | 2013.07.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.07.26 | සිකුරාදා | 2013.07.12 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2013.08.02 | සිකුරාදා | 2013.07.19 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.08 | බ්‍රහස්පතින්දා | 2013.07.26 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.16 | සිකුරාදා | 2013.08.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.08.23 | සිකුරාදා | 2013.08.08 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2013.08.30 | සිකුරාදා | 2013.08.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2013.09.06 | සිකුරාදා | 2013.08.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.13 | සිකුරාදා | 2013.08.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.20 | සිකුරාදා | 2013.09.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2013.09.27 | සිකුරාදා | 2013.09.13 | සිකුරාදා | දහවල් | 12.00 |

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ. බ.)*

2013 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.